## මධ්‍යම පළාත් සභාවේ ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයෙහි සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂ (තාක්ෂණ) තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය

**01.** **සම්බන්ධ වන ආයතන**

1.1 දෙපාර්තමේන්තුව : මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව

යොමු අංකය : CPC/SD/3 දිනය : 2017.02.22

1.2 අමාත්‍යාංශය : මධ්‍යම පළාත් ක්‍රීඩා විෂය භාර අමාත්‍යාංශය

යොමු අංකය : CPC/MI/HRM/11/08/06 දිනය : 2019.01.22

1.3 මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය :

යොමු අංකය : CPC/CS/2/3/S.M/1 (IV) දිනය : 2019.01.31

1.4 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම

යොමු අංකය : DMS/CP/0319 දිනය : 2016.10.18

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :

යොමු අංකය : NSCC/10/71/5/SR දිනය : 2019.05.10

1.6 මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :

යොමු අංකය : CPC/PSC/30/14/02 දිනය : 2019.12.17

**02.** **ක්‍රියාත්මක දිනය** : මෙම පරිපාටිය මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරනු ලබන දින සිට ක්‍රියාත්මක වේ.

**03.** **පත් කිරීම් බලධරයා පිළිබඳ විස්තරය**

3.1 පත් කිරීම් බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**04.** **සේවා ගණය පිළිබඳ විස්තර**

4.1 සේවා ගණය : විධායක

4.2 ශ්‍රේණිය : III ශ්‍රේණිය

4.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

පොදු ස්වභාවය අනුව ප්‍රතිපත්ති සම්පාදනය, විධානය / අණ දීම , කළමනාකරණය හා ඒ හා සම්බන්ධ තීරණ ගැනීම යන කාර්යයන්ට ඇතුළත් වූ ද ආයතනයේ ඉහළම විධායක නිලධාරියාට පැවරෙන සමස්ථ කාර්යභාරයේ අන්තර්ගත කාර්යයන් අතරින් තනතුර නිශ්චිත කොට පවරා දෙනු ලබන කාර්යයන් පැවරෙන සේවා ගණයකි.

4.4 කාර්යයන් පැවරීම :

තනතුරට අදාළ කාර්යයන් නිශ්චිත වශයෙන් දක්වා ඇති දෙපාර්තමේන්තුගත තනතුරක් වන මෙම සේවා ගණයට පැවරෙන ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කොට ගෙන දෙපාර්තමේන්තු ප්‍රධානියා හා ක්‍රීඩා විෂය භාර පළාත් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පවරනු ලැබිය හැක.

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2021 . 05 . 18 දින අනුමත කරන ලදී
පී.කේ. අබේරත්න
ප්‍රධාන [illegible] සේවා නිලධාරි
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
මධ්‍යම පළාත

**05.** **තනතුරෙහි ස්වභාවය** : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

**06.** **වැටුප්**

6.1 වැටුප් කේත අංකය : SL- 1-2016

6.2 වැටුප් පරිමාණය : රු.47615-10x1335-8x1630-17x2170-රු.110,895/-

6.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර:

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III ශ්‍රේණිය | 01 වන පියවර | 47615/- |

6.4 වැටුප් ගෙවීම හා අනෙකුත් කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධාන අනුව විය යුතු අතර, රජය විසින් කලින් කලට ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු වේ.

**07.** **සේවා ගණයට අයත් තනතුර / තනතුරු**

7.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණි | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ) | III ශ්‍රේණිය | 01 | • පළාතේ දිස්ත්‍රික්ක 03 සඳහා ක්‍රියාත්මක කෙරෙන ක්‍රීඩා සංවර්ධන කටයුතු අධීක්ෂණය කිරීම.<br>• දිස්ත්‍රික් හා පළාත් ක්‍රීඩා තරඟවල, තාක්ෂණික කටයුතු අධීක්ෂණය කිරීම හා පළාත් පුහුණු කඳවුරු අධීක්ෂණය කිරීම.<br>• නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කර පැවැත්වීම.<br>• දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන හා සැමට ක්‍රීඩා වැඩසටහන යටතේ කටයුතු සැළසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය.<br>• දිස්ත්‍රික් අන්තර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ක්‍රීඩා තරඟවල තාක්ෂණික කටයුතු අධීක්ෂණය හා වාර්ෂික ක්‍රීඩා වැඩසටහන්වල තාක්ෂණික කටයුතු අධීක්ෂණය.<br>• දෙවන පෙළ සංචිත හා සංවර්ධන සංචිත විධිමත්ව පවත්වාගෙන යාම හා අධීක්ෂණය. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021.5.18 දින
අනුමත කරන ලදී

පී.ජේ. අබේරත්න
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
මධ්‍යම පළාත

| | | | |
|---|---|---|---|
| | | | • ප්‍රාදේශීය, දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ හා වෙනත් ක්‍රීඩා පිටි පිළිබඳ තාක්ෂණ කටයුතු.<br>• ක්‍රීඩා විද්‍යායතනයේ පාඨමාලාවල තාක්ෂණික කටයුතු.<br>• මධ්‍යම රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රීඩා සහ අනෙකුත් වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.<br>• අධ්‍යාපන අමාත්‍යාංශය හා අනෙකුත් බාහිර ආයතන සමග සම්බන්ධීකරණය.<br>• ඉහත සියලු කාර්යයන් පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ අධ්‍යක්ෂ හා ඉහළ කළමනාකාරීත්වයට වාර්තා කිරීම. |

7.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : එකයි.

**08. බඳවා ගැනීමේ ක්‍රමය :**

8.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නොවේ |
| සීමිත | අදාළ නොවේ |
| කුසලතා | 100% |

8.2 කුසලතා පදනම මත බඳවා ගැනීම :

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2021.5.18 දින අනුමැතිය ලදී
පී.කේ. ඇබේරත්න
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
මධ්‍යම පළාත

8.2.1. බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

8.2.2 සුදුසුකම් :

8.2.2.1 අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

I. මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික්/ මූලස්ථාන ක්‍රීඩා නිලධාරී තනතුරෙහි නිලධරයෙකු වීම.

හෝ

II. මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා පුහුණුකරු තනතුරෙහි I ශ්‍රේණියෙහි නිලධරයෙකු වීම.

හෝ

III. මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා පුහුණුකරු තනතුරෙහි II ශ්‍රේණියෙහි නිලධරයෙකු වීම.

8.2.2.2 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම මධ්‍යම පළාත තුල ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

8.2.2.3. වෙනත් සුදුසුකම්

I. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට 8.2.2 යටතේ දක්වා ඇති සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

II. පූර්වාසන්න වසර පහක් (05) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ මට්ටමක කාර්ය සාධනයක් සහිතව සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

8.2.3. වයස : අදාළ නොවේ

8.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

8.2.4.1. ලිඛිත විභාගය : අදාළ නොවේ.

8.2.4.2. වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

8.2.4.3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

8.2.4.4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

8.2.4.4.1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : ලකුණු පරිපාටිය ඇමුණුම 01 පරිදි වේ.

(සුදුසුකම් පරීක්ෂා කිරීමද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදීම සිදුකරනු ලබයි.)

සටහන -:

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව අයදුම්කරුවන් මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂ (තාක්ෂණ) SL I – 2016 සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂ (තාක්ෂණ) තනතුරට බඳවා ගනු ලැබේ.

8.2.4.4.2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා : මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

8.2.4.4.3. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : මධ්‍යම පළාත් ක්‍රීඩා විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ ඉල්ලීම පරිදි මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් අභ්‍යන්තර නිවේදනයක් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021 . 5 . 18 දින
අනුමත කරන ලදී

පී.කේ.අබේරත්න
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
මධ්‍යම පළාත

**09. කාර්යක්ෂමතා කඩඉම් :**

9.1.

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය (ලිඛිත පරීක්ෂණය /වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව /වෙනත්) | විෂය නිර්දේශය |
|---|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය | ඇමුණුම 02 |

9.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද ?:

වසරකට දෙවරක්

9.3. කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයා :

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන රාජ්‍ය ආයතනයක් විසින්

**10. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය**

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 1. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021-5-18 දින
අනුමත කරන ලදී

**11. ශ්‍රේණි උසස් කිරීම** : අදාළ නොවේ.

**12. තනතුරුවලට පත් කිරීම** : අදාළ නොවේ.

පී.කේ.අබේරත්න
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
මධ්‍යම පළාත

**13. නිර්වචනය**

13.1 "පරිපාටිය" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ) තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියයි.

13.2 "ආණ්ඩුකාරතුමා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා / තුමිය වේ.

13.3 "කොමිෂන් සභාව" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

13.4 "ප්‍රධාන ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වේ.

13.5 "අමාත්‍යාංශ ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ක්‍රීඩා විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.

13.6 "ආයතන ප්‍රධානියා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වේ.

13.7 "සතුටුදායක සේවා කාලය" යනුවෙන් අදහස් කරනුයේ, රජයේ නිලධරයකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරීම මගින්ද, සමත්විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම මගින්ද, සිදුකළ යුතුව තිබූ පත්වීම් ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද, එම කාලය තුළදී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වන්නේය.

13.8 "සක්‍රීය සේවා කාලය " යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් රජයේ අනුමත සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

**14.** **ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :** අදාළ නොවේ

**15.** අන්තර්කාලීන විධිවිධාන : අදාළ නොවේ

**16.** සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි, මධ්‍යම පළාත් මූල්‍ය රීති හා රජය විසින් හෝ පළාත් සභාව විසින් කළින් කලට පනවනු ලබන නීති රීති හා රෙගුලාසි අදාළ වේ.

**17.** මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගරු ආණ්ඩුකාරතුමා / තුමිය විමසා ගරු ආණ්ඩුකාරතුමා /තුමිය අනුමැතිය පරිදි තීරණය කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021.5.18 දින
අනුමත කරන ලදී

පී.කේ.[illegible]
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
මධ්‍යම පළාත

**ක්‍රීඩා ක්ෂේත්‍රයේ ඒකාබද්ධ සේවයේ විධායක සේවා ගණයේ සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීම - ලකුණු ලබා දීමේ පරිපාටිය**

| අනු අංක | ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | කරුණු | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අතිරේක සේවා පළපුරුද්ද | "සියලුම අයදුම්කරුවන්හට පහත I, II හා III නිර්නායක එකක් හෝ කිහිපයක් හෝ සියල්ල යටතේ උපරිම ලකුණු ප්‍රමාණයට යටත්ව ලකුණු ලබා ගත හැක."<br><br>I. මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් / මූලස්ක්‍රීඩා නිලධාරී තනතුරෙහි තනතුරට පත්වූ දින සිට වසරකට ලකුණු 06 බැගින් ( මාස 06 කට වැඩි සේවා කාලයක් සඳහා ලකුණු 03 බැගින් හිමිවේ.<br><br>II. මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා පුහුණුකරු තනතුරහි I ශ්‍රේණියේ තනතුරට පත්වූ දින සිට වසරකට ලකුණු 05 බැගින් ( මාස 06 කට වැඩි සේවා කාලයක් සඳහා ලකුණු 2.5 බැගින් හිමිවේ. )<br><br>III. මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා පුහුණුකරු තනතුරහි II ශ්‍රේණියේ තනතුරට පත්වූ දින සිට වසරකට ලකුණු 02 බැගින් ( මාස 06 කට වැඩි සේවා කාලයක් සඳහා ලකුණු 1 බැගින් හිමිවේ. ) | 30 |
| 02 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් ඕනෑම පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ ඕනෑම පශ්චාත් උපාධියක් (1ක්) සඳහා **ලකුණු - 20**<br><br>II. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් ක්‍රීඩා ක්ෂේත්‍රයේ හෝ ශාරීරික පුහුණු ක්ෂේත්‍රයේ උපාධියක් (1ක්) සඳහා **ලකුණු - 15**<br><br>III. පිළිගත් ආයතනයකින් ලබා ගත් ක්‍රීඩා ක්ෂේත්‍රයේ හෝ ශාරීරික පුහුණු ක්ෂේත්‍රයේ ඩිප්ලෝමාවක් (1ක්) සඳහා (වසරකට නොඅඩු) **ලකුණු - 10**<br><br>IV. පිළිගත් ආයතනයකින් ලබා ගත් ක්‍රීඩා ක්ෂේත්‍රයේ හෝ ශාරීරික පුහුණු ක්ෂේත්‍රයේ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා (මාස 06 කට නොඅඩු) ලකුණු - 05<br><br>(මූලික සුදුසුකම් සඳහා ලකුණු ලබා නොදේ.) | 20 |

2021.5.18 දින
අනුමත කරන ලදී

පී.කේ.අබේරත්න
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
මධ්‍යම පළාත

| | | | |
|---|---|---|---|
| 03 | අනු අංක 01 හි, I හෝ II හෝ III යන කවර හෝ නිර්නායකයක් සම්පූර්ණ වන දින සිට දක්වන ලද විශේෂ දක්ෂතාවයන් | 1. පුහුණුකරුවෙකු හෝ පරිපාලකවරයෙකු හෝ සංවිධායකයෙකු හෝ වෙනත් නිලතලයක් දරමින් සහභාගී වීම (එක් සහභාගී වීමක් සඳහා ලබා දිය යුතු ලකුණු පහත දක්වා ඇත.)<br>I. පොදු රාජ්‍ය මණ්ඩලීය ලෝක ශූරතා ලකුණු - 15<br>II. දකුණු ආසියාතික මට්ටමින් ලකුණු - 10<br>III. ජාතික මට්ටමින් ලකුණු - 05 | 15 |
| | | 2. 230B දරණ පොදු ආකෘතියෙන් ලබා ඇති ප්‍රශංසා සහතික සඳහා එක් සහතිකයකට ලකුණු 02 බැගින් | 10 |
| 04 | අමතර වෘත්තීය සුදුසුකම් | ක්‍රීඩා හෝ පරිපාලන හෝ කළමනාකරණය ආශ්‍රිත විෂයන් පිළිබඳව හදාරන ලද දේශීය හෝ විදේශීය පාඨමාලා සඳහා<br>I. වසරක් හෝ ඊට වැඩි ලකුණු - 10<br>II. මාස 06 ක් හෝ ඊට වැඩි ලකුණු - 05<br>III. සති 02 කට වඩා වැඩි මාස 06 කට අඩු ලකුණු - 03<br>IV. සති 02 කට වඩා අඩු දින 02 කට වඩා වැඩි ලකුණු - 02 | 20 |
| 05 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය | | 05 |
| | | එකතුව | 100 |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021.5.18 දින
අනුමත කරන ලදී

ජී.කේ. අබේරත්න
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
මධ්‍යම පළාත

ඇමුණුම - 02

<u>**මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂ ( තාක්ෂණ ) සඳහා I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.**</u>

01. විභාගය පිළිබඳ විස්තරය : III ශ්‍රේණියට පත්වී වසර තුනක් (03) ගතවීමට පෙර සමත් විය යුතුය

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 01. ක්‍රීඩා පනත | පැය 02 | 100% | 40% |
| 02. ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | පැය 02 | 100% | 40% |

02. විභාගය පවත්වනු ලබන බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

03. විභාගය පවත්වනු ලබන කාල සීමාව : වසරකට දෙවරක්

04. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. ක්‍රීඩා පනත | ක්‍රීඩා පනත ආශ්‍රයෙන් සකස් කරනු ලබන ප්‍රශ්න පත්‍රයකි. |
| 2. ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | 1. ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද<br>I, II, III, V, VI, VII, IX, XI, XII, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII හා XLVIII<br>2. මුදල් රෙගුලාසි සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද<br>I, II, III, IV, VI, VIII |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021-5-18 දින
අනුමත කරන ලදී

ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
මධ්‍යම පළාත

මධ්‍යම පළාත් සේවා කොමිෂන් සභාවේ නිර්දේශය : - නිර්දේශ කරමු.

01. පී.ජී. අමරකොන් මහතා (සභාපති) ..............................

02. ඩබ්ලිව්.එම්.එස්.ඩී. වීරකෝන් මහතා (සාමාජික) ..............................

03. ඒ.එම්.ආර්.බී. තෙන්නකෝන් මහතා (සාමාජික) ..............................

04. එන්.ඩී.කේ. පියුම්සිරි මහතා (සාමාජික) ..............................

05. ඒ.එම්. වයිස් මහතා (සාමාජික) ..............................

06. කේ.ආර්. ක්‍රිෂාන් මහතා (සාමාජික) ..............................

07. එච්.එම්.ඩී.ආර්. හේරත් මහතා (සාමාජික) ..............................

දිනය 2019.12.17

ආණ්ඩුකාර ලේකම්,

2019.12.17 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 19/1615 යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද "මධ්‍යම පළාත් සභාවේ ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයෙහි සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂ (තාක්ෂණ) තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය" ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2020.05.15

..............................

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

මධ්‍යම පළාත

නිල මුද්‍රාව

එම්.ජී.ඒ. තිලකරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

2021-05-18

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය :- අනුමත කරමි. / ~~නොකරමි~~.

නීතිඥ ලලිත් යූ. ගමගේ
ආණ්ඩුකාරවර
මධ්‍යම පළාත